කථිකාචාර්ය කෞශල්‍යා හේවාවසම්

අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

විශෝධනය CRIM 3109.03

අත්පත්‍රිකා අංක 01

බන්ධනාගාරගතකරණය

නූතන අපරාධ යුක්ති ක්‍රමයේ වරදකරුවන්ට දඬුවම් පැමිණවීම සඳහාත් ඔවුන් පුනරුත්ථාපනයෙහි ලා ත් බන්ධනාගාර යොදා ගැනීම වඩාත් ජනප්‍රිය ක්‍රමවේදයක් වශයෙන් හඳුනාගත හැකිය. මේ සම්බන්ධ ඓතිහාසික තොරතුරු මෙන්ම නූතනයේ භාවිතා කරන ක්‍රමවේදයන් ද අධ්‍යයනය කිරීම මෙම විෂයය මාලාව යටතේ සාක්ෂාත් කරගන්නා ප්‍රධාන අරමුණකි. ඒ සම්බන්ධ මූලික ප්‍රවේශයක් වශයෙන් පහත දැක්වෙන කරුණු පිළිබඳව අධ්‍යනය කරන්න.

අතීත සමාජයේ මෙන් ම නූතන සමාජයේ ද අපරාධයක් සිදුකළ පුද්ගලයෙකුට එකී වරදට සමාන දඬුවමක් වශයෙන් සිරගත කිරීම හෙවත් බන්ධනාගාරගතකරණය සිදු කරන ලදි. Prison යනුවෙන් ඉංග්‍රීසියෙන් ව්‍යවහාර වන බන්ධනාගාරය පිළිබඳ අර්ථ විග්‍රහ කිරීමේදී,

Prison - "A building for the confinement of criminals or those awaiting trail"

අපරාධකරුවන් හෝ නඩු විභාගය තෙක් රැඳී සිටින සැකකරුවන් රඳවා තබා ගන්නා ස්ථානය බන්ධනාගාරය වේ (Oxford Dictionary; 1999, 1137).

දඬුවම් ලබාදීමෙහි ලා පුද්ගලයන් සිරගත කිරීමේ දඬුවම පැවතුණේ හා ක්‍රියාත්මක කරන ලද්දේ අද ඊයෙක සිට නොවේ. පුරාණ සාහිත්‍ය වුවද සීරුවෙන් පරීක්ෂා කිරීමේ දී මෙම කාරණය තවදුරටත් සනාථ කොට ගත හැකිය. පුරාණ වංශකථා අතර සිංහබාහු විසින් තම පියාව සිරගත කිරීමත්, කුවේණිය විසින් තම්මැන්නාවට බැසි විජය ඇතුළු හත්සියයක් පිරිවර උපක්‍රමයෙන් සිරගත කළ පුරාවෘතයන් ඊට සාක්ෂි සපයයි. කෙසේ වෙතත් සිරගත කිරීම පළි ගැනීම හෝ වේදනාව ලබාදීම උදෙසා මුල් කාලීන සමාජයේ

Don't Copy

භාවිතා වූ සැටි අපුරුය. විටෙක පැරණි සිංහල සාහිත්‍ය විමසන්නෙකුට එය ප්‍රත්‍යක්ෂ කරගනු වස් හමුවන කථා, සිදුවීම් අතිමහත්ය. "රජවරු සිය අභිෂේක අවස්ථාවන්හි දී හෝ වාසනාවන්ත අවධියකින් පසුව හෝ වැරදිකරුවන්ට සමාව දීමට පුරුදුව සිටියහ. 5 වන සියවසේ දී සිරිමේඝවර්ණ රජු මතින් ද තෙරුන් වහන්සේට උපහාර පිණිස පවත්වන ලද උත්සව අවස්ථාවේ දී බන්ධනාගාරගත සිරකරුවන් මුදා හරින බව කියවේ" (මහාවංශය 37.71).

"මනාහරණ තම පුත් කුමරු (පසුව මහා පරාක්‍රමබාහු) උපන් අවස්ථාවේ දී බන්ධනාගාරයන් හි වැටී සිටි බොහෝ දෙනෙකු නිදහස් කර හැරියේය" (මහාවංශය 62.42). පරාක්‍රමබාහු ඇවැමෙන් රජ පැමිණි ඔහු බෑණනුවන් වූ II විජයබාහු රජ තම රාජාභිෂේකය නිමිත්තෙන් තම මලණුවන් විසින් බන්ධනාගාරගත කොට වධ බන්ධනාදියෙන් පීඩා කළ ජනයා එම දුකින් මිදුවේය (මහාවංශය 80. 2. 3). 13 වන සියවසේ දී II පරාක්‍රමබාහු රජ අපරාධකරුවන්ට පනවන ලද සියලු දණ්ඩනයන් ලිහිල් කොට පොදුවේ කාහටත් සමාව දුන්නේය (මහාවංශය 83. 4).

උඩරට රාජධානියේ බ්‍රිතාන්‍ය වාර්තාකරුවෙකු ව සිටි රොබට් නොක්ස් 1641 - 04 - 04 සිට 1660 - 02 - 08 දින දක්වා සිරගත කිරීමේ දඬුවම අත්විඳි චුදිතයෙකු බවට පත්ව සිටියේය. ග්‍රාමීය වශයෙන් සිරගත කිරීම හුදෙක් දඬුකදේ ගැසීම තුළින් ම සපත කරගන්නා ලදි. එකල්හි නැවත අපරාධයක් කරන්නට සිතා පැනයාමක් ගැනවත් ඔවුනට සිතන්නටවත් නොහැකිය (Knox, R., 1681; 5). මේ අනුව අතීත සමාජයේ ද දඬුවමක් වශයෙන් සිරගත කිරීම යොදාගැනීම අපරාධ පාලනය හා නිවාරණ කාර්යය තවදුරටත් සාර්ථක කරගැනීම උදෙසාම යොදා ගන්නා ලදි. නූතන සමාජයේ සිරගත කිරීම, බන්ධනාගාරගත කිරීම පිළිබඳ අදහස් විමසීමේ දී එ තුළින් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු ද විවිධාකාර ස්වරූපයක් ගන්නා බව පැහැදිලිය.

වැරදි කරන පුද්ගලයා හෝ වැරදි සිදුකිරීමට ඉඩ ප්‍රස්තාව පවතින පුද්ගලයින් සමාජීය වශයෙන් අපරාධ, වැරදි සිදු කිරීමේ හීන තත්ත්වයකට පත් කිරීම, සිරගත කිරීම තුළින් බලාපොරොත්තු වන එක් කරුණක් පමණි. එය අපරාධ පාලනයෙහි හා නිවාරණයෙහි වැදගත් වේ. තවද බන්ධනාගාරය අපරාධ සිදුකළ පුද්ගලයාට දුක වේදනාව ම හිමිකොට දිය යුතු අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ආදි කාලීන සමාජයේ

Don't Copy

යොදා ගන්නා ලදි. විශේෂයෙන් ජරා ජීර්ණ, අපිරිසිදු, සෝෂාකාරී, පීඩාකාරී සමාජ වටපිටාවකින් යුතු සිරගෙදර පුද්ගලයා පීඩාවට පත්කිරීමට හේතු වන අතරම, ඒවා දක්නා බාහිර සමාජය ද එවන් ස්ථානවලට යාමට බියක් දක්වනු ලබයි. ඉන්දියාවේ සිර ගෙවල් මෙම ලක්ෂණවලට ගැළපෙන පරිදි ප්‍රධාන නගරයන්ට සෘජුවම මුහුණ ලා පවතී.

"රටේ ප්‍රධාන නගරයේ පිරිමි හා ගෑනු දෙගොල්ලට ම බන්ධනාගාර තිබූ බවත්, ඒවායේ "ද්වාර" මනාව ආරක්ෂා කළ යුතු බවත් කියයි. මනු නීතියට අනුව (1 ×288) මහමාවතට ළඟ හිරගේ පිහිටිය යුතුය. මන්ද? හිරකරුවන් විඳින දුක මහජනයාට ප්‍රදර්ශනය වීම පිණිසය. එය දකින ජනතාව අපරාධවලින් ඈත්වෙයි" (රත්නපාල: 1991, 174).

බන්ධනාගාර අපරාධ පාලනයෙහි හා නිවාරණයෙහි සිදු කරනු ලබන්නේ අතිවිශාල කාර්යය භාරයකි. සමාජයේ සාමාන්‍ය පුද්ගලයින්ට අපරාධකරුගෙන් සිදුවිය හැකි හානිය අවම කිරීමත් සිරගෙවල් තුළ එක් ව වාසය කරන සිරකරුවන්ගේ ආරක්ෂාව තර කිරීමත් ඉන් සිදුවිය. මේ සඳහා බන්ධානාගාර විකාශනය තුළ විවිධාකාර වූ වැදගත් අවස්ථා හමුවනු ඇත. අපරාධ පිළිබඳවත්, දඬුවම් පිළිබඳවත් අදහස් දැක්වූ බෙන්තම්, බෙකේරියා, හා හෝවාර්ඩ් වැනි විද්වතුන්ගේ අදහස් තුළින් එංගලන්ත සමාජය තුළ මූලික වශයෙන් හිරගෙවල් නම් වූ සංකල්පය සංවර්ධනය විය. එම විද්වත් මතයන් හි ආලෝකය සිරගෙවල් සංකල්පයට ප්‍රබල ලෙසම ඉවහල් වී ඇති බව කිව යුතුය. එම අදහස් අනුව මුලින් කී සිරගෙවල කුටි වෙන වෙනම සැකසිය යුතු ආකාරයත්, සිරකරුවෝද ඔවුනොවුන් වශයෙන් වෙන් කොට තැබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි. සිරගෙවල් හා එහි විකාශය පිළිබඳව කථා කරන විට බන්ධනාගාරගත සිරකරුවන්ට 1932 පමණ වන විට රොබට් ෆීල් විසින් හඳුන්වා දුන් බන්ධනාගාර ක්‍රමය තුළ සිරකරුවන් එකිනෙකාට සහයෝගී ව කටයුතු කිරීමට අවස්ථාව ලබාදෙන ලදි. සාමූහික ජීවිතයක් තුළින් තවදුරටත් අපරාධ පිළිබඳවත්, දඬුවම පිළිබඳවත් උග්‍ර පශ්චාත්තාපී භාවයකට පත්වීමට පවත්නා ඉඩ අහුරවාලීමක් එමගින් සිදුවුණි (White R. C, 1937, 11: p 234 - 246).

Don't Copy

සිරගෙවල් ප්‍රතිසංස්කරණයෙහි ලා ඉතා වැදගත් අදහස් ඉදිරිපත් කරන ලද කැප්ටන් ඇලෙක්සැන්ඩර් මැකොන්චි සිරකරුවන්ට හිතකාමී සමාජ පරිසරයක් ස්ථාපනයෙහි ලා වැදගත් කරුණු කිහිපයක් ම දක්වන ලදි. ඔහුට අනුව දණ්ඩනවේදය ලක්ෂණ දෙකකින් යුක්ත විය යුතුය.

1. දඬුවම්, පළිගැනීමට හෝ වෙනත් එවන් පරමාර්ථයක් උදෙසා සකස් නොවිය යුතුය
2. හිරකරුවෙකු හිරගෙට නියම කිරීම නිශ්චිත වෙනස් කිරීමට නොහැකි කාලපරිච්ඡේදයක් සඳහා නොවිය යුතුය. ඒ කාලසීමාව ඔහුගේ පැවැත්ම අනුව අඩුකරගත හැකි එකක් විය යුතුය " (රත්නපාල: 1991, 142). මේ අනුව සිරගෙදර යහපත් චර්යාවන් සහිත පුද්ගලයින් පස් වැදෑරුම් යුතුව, වර්ගීකරණයක් සිදු කරනලදි.

    - තදබල සිරදඬුවම් විඳීම
    - රජයේ දම්වැල් දමා වැඩගන්නා රංචු හෝ සමූහ සමග ශ්‍රම කාරියෙහි යෙදවීම
    - සීමාසහිත නිදහසක් ලබාදීම
    - යම් යම් තත්ත්වයන් යටතේ නිදහස ලබාදීම
    - සම්පූර්ණ නිදහස ලබාදීම (White, 1937; 269).

මෙම සංකල්ප වර්තමාන බන්ධනාගාර සංකල්පය සමග යම්තාක් දුරට සමානකම් දක්වනු ලබයි.

පෙන්සිල්වේනියා බන්ධනාගාර ක්‍රමය තුළ ද සිරකරුවන් උදෙසා විශේෂිත වූ පහසුකම් සහිත බන්ධනාගාර ක්‍රමයක් වශයෙන් සංස්ථාපනය විය. එය ප්‍රමුඛ මූලධර්ම 5 ක් යටතේ විකාශනය විය.

1. සිරකරුවන්ගෙන් පළිගැනීම මුල්කොට හිරගෙදර ජීවිත සකස් විය යුතු නැත. බන්ධනාගාර ජීවිතය සකස් විය යුත්තේ මහන්සි වී කරන වැඩ මාර්ගයෙන් ඒ සිරකරුවන්ගේ ජීවිතය වෙනස් කිරීම උපයෝගි කරගෙනය.
2. බන්ධනාගාරයේ අවශේෂ සිරකරුවන් හා තවත් අය වෙතින් සිරකරුවන් කෙරෙහි ඇතිවන අයහපත් බලපෑම අඩු කිරීම හා ඒ අයගේ බලපෑමෙන් ඉවත් කිරීම, තනිකුටි සාදා ඇත්තේත්, හුදකලාවම ජීවිතය ගෙනියන්නට මාර්ගය සකස් කොට ඇත්තේ ත් ඒ නිසාය.

Don't copy

3. හුදකලාව ඉන්නා විට හිරකරුට තමාගේ වැරදි ගැන (කළ අපරාධ ගැන) තනිව සිතාමතා, පශ්චාත්තාපී විය හැකිය.
4. මිනිසා ස්වභාවයෙන් ම සමාජ සත්ත්වයෙකි. සමාජ ආශ්‍රයට ප්‍රිය වන්නේය. ඔහු ඒ නිසා ඒ සමාජයේ ඇත්කොට තනිකොට - තිබීම ඔහුට දඬුවමක් වන්නේය.
5. හුදකලාව හිරදඬුවම ආර්ථික අතින් එතරම් වියදම් හෝ පාඩු සිදුවන බරපතල එකක් නොවේ. ඉතා විශාල ප්‍රමාණයක නිලධාරීන් හෝ මුරකරුවන් රැසක් ඊට අවශ්‍ය වන්නේ නැත. ඇඳුම් පැළඳුම්වලට පවා යන වියදම අඩුය (Joanne Danifo, 2007). එසේම පෙන්සිල්වේනියා බන්ධනාගාර ක්‍රමවේදය තුළ සිරකරුවන්ට වඩාත් හිතකාමී පරිසරයක් ඇති කිරීම උදෙසා සකසා ඇත.

ප්‍රධාන වශයෙන් බන්ධනාගාර ක්‍රමය ප්‍රධාන පරමාදර්ශ 04 ක් යටතේ සංස්ථාපනය වී ඇති බව ඒ පිළිබඳ ව විමසීමේ දී පැහැදිලි වේ.

- අධිකරණ ආකෘතිය (Justice Model)
- අශක්නුකරණ ආකෘතිය (Custodial Model)
- ප්‍රත්‍යානුකලන ආකෘතිය (Least restrictive alternative Model)
- ප්‍රතිසමාජානුයෝජන ආකෘතිය (Rehabilitation Model)

(Snarn, R. W., 1996;50).

අධිකරණ ආකෘතිය තුළින් සිදු කරනුයේ අපරාධ යුක්තිය පසඳලීමේ කාර්යයයි. එසේම අධිකරණයේ සිදුවන නඩු තීන්දු අනුව අශක්නුකරණ ආකෘතියට එළැඹෙනු ඇත. සිරකරුවන්ගේ චර්යා පාලනය, සිරගෙදර සිටින නිලධාරීන් යටතේ පාලනය වීම මෙම ආකෘතිය තුළින් ක්‍රියාත්මක වේ. ප්‍රත්‍යානුකලන ආකෘතිය තුළින් සිරකරුවන් වෘත්තීය, මනෝ විද්‍යාත්මක, සෞන්දර්යාත්මක, අධ්‍යාපනික වශයෙන් ලබාදෙන පුනරුත්ථාපනමය කාර්යය භාරය අදහස් වේ. සිරගෙදරින් නිදහස් ව යන පුද්ගලයා නැවත එකතු වනුයේ සමාජයටය. එබැවින්, සිරගත වූ පුද්ගලයා සිර ගෙදර වසන කාලය තුළම බාහිර සමාජ පවුල සාමාජිකයින් සමග සබඳතා පවත්වා ගෙන යාමට අවශ්‍ය වටපිටාව අවසන් වශයෙන්

Don't Copy

ප්‍රතිසමාජානුයෝජන ආකෘතිය තුළින් ගම්‍ය කරනු ඇත. බන්ධනාගාරගතකරණය තුළින් අපරාධ සිදුවීමේ ප්‍රවණතාවය ප්‍රබල වශයෙන් ම අවම කොට ගත හැකි බව විවිධ පර්යේෂණ තුළින් ද අනාවරණය වී ඇති කරුණකි. ජොවාන් පීටර්සීලියා හා පීටර් ග්‍රීන්වුඩ් (Joan Petersilia and Peter Greenwood) ප්‍රකාශ කරන ආකාරයට සෑම බරපතල අපරාධකරුවෙකු ම වසරකට සිරගත කිරීම තුළින් අපරාධ සිදුවීමේ ප්‍රවණතාවය 15 % කින් අවම කොට ගත හැකිය (Petesilia and Greenwood; 1978). නමුත් මීට විරුද්ධ අදහස් ද වර්තමානය වනවිට විවිධ විචාරකයින් විසින් ඉදිරිපත් කොට ඇති අතර ඒ අනුව බන්ධනාගාර යනු අපරාධ උගන්වන ස්ථාන බවට සඳහන් කිරීම මෙහිදී විශේෂයෙන් වැදගත් වේ. මන් ද විවිධ අපරාධයන්ට වරදකරුවන් වූ හා නිසි ලෙස වරදකාරීත්වය ඔප්පු නොවූ පුද්ගලයින්ද එකට එක් කොට පැවතීම තුළ අපරාධ ඉගෙනීමේ හැකියාව පවතී. අන්තර් ආශ්‍රය තුළින් අපරාධ ඉගෙනගන්නා තැන් වශයෙන් මෙවැනි ස්ථාන හඳුන්වා ඇත. බන්ධනාගාරය යන සංකල්පය වර්තමානය වනවිට සිරකරුවාට වඩාත් හිතකාමී පරිසරයක් ගෙනදීමට ලෝකයේ බොහෝ රටවල් ක්‍රියාත්මක වී ඇත. බන්ධනාගාර පිළිබඳව කථා බහ කිරීමේ දී රිමාන්ඩ් බන්ධනාගාරයට ද ලැබෙනුයේ ඉතා වැදගත්කමකි.

පළමු සතිය - පැවරුම් අංක 01

බන්ධනාගාරගතකරණය හා ඒ සම්බන්ධ මූලික සංකල්පයන් පිළිබඳ හැඳින්වීමක් කරන්න (නිර්වචන ආශ්‍රයෙන්)

මේ සම්බන්ධයෙන් ඔබට අන්තර්ජාල ලිපි මූලාශ්‍ර කොට ගත හැකි අතර එම ලිපි මගින් බන්ධනාගාරය හා සම්බන්ධ මූලික සංකල්ප (චූදිතයා, වරදකරු, සැකකරු, බන්ධනාගාරගතකිරීම, සිරගත කිරීම රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම) පිළිබඳ නිබන්ධනයක් සකසන්න

Don't Copy